## 3. ශීර්ෂය 1– අතිගරු ජනාධිපතිතුමා

### 3.1 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවාට ඉදිරියෙන් සඳහන් කර ඇති විගණන සාක්ෂි ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදි එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

| ගනුදෙනුව | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සඳහා කුලි | 61,353,428 | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් මාධ්‍ය උපකරණ වෙනත් මාධ්‍ය ප්‍රචාරක කාර්යයන්හි යොදවා ඇද්ද යන්න පිළිබඳව විමසීම් කරන ලද ලිපිවල පිටපත් |
| ලිබඩු සහ කැනපි කුලියට ගැනීම | 30,866,510 | අදාල අවශ්‍යතාවය සහ අවශ්‍ය ප්‍රමාණය පිළිබඳ දළ ඇස්තමේන්තු |
| තෙවන පාර්ශවයක් වෙත ලබාදුන් කාර්යයන් | 32,781,120 | ඔවුන් සමඟ ඇතිකර ගත් ගිවිසුම්වල පිටපත් |
| **එකතුව** | **125,001,058** | |

### 3.2 විසර්ජන ගිණුම

#### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 68 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

#### (ආ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

වැය විෂයයන් 23 කට සළසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.963,021,140 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.3 අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව අවස්ථා 64 කට අදාලව ලබා දී තිබුණු එකතුව රු.7,443,480 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දුන් කාර්යය නිමවූ වහාම නිරවුල් කළ යුතු වුවත්, එම කාර්යයන් නිමවී මාස 02 ක සිට මාස 12 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි.

**3.4 අවිධිමත් ගනුදෙනු**

2014 වර්ෂයේ සමාජ සාරධර්ම හා ආගමික සම්ප්‍රදායන් සුරැකීම උදෙසා ජනතාව දැනුවත් කිරීම අරමුණු කර ගත් ජාතික වැඩසටහන යටතේ සිල් රෙදි මිලදී ගැනීම වෙනුවෙන් 599,999,505 ක වියදමක් කර තිබුණි. මෙම වැඩසටහන වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සෘජුව ජනාධිපති කාර්යාලයේ නිල බැංකු ගිණුමට රු.මිලියන 600 ක් ප්‍රේෂණය කර තිබුණි. මෙම මුදල රෙගුලාසි සංග්‍රහයේ 170(2) ප්‍රකාරව ත්‍යාග වශයෙන් ලද මුදලක ලෙස සළකා කටයුතු කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. පාසල් නිල ඇඳුම් සම්බන්ධයෙන් රෙදි මිලදී ගැනීමට අදාලව 2014 සැප්තැම්බර් 04 දිනැති අංක 14/1223/563/002 –I/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සිල් රෙදි මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

**3.5 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

අරලියගහ මන්දිරයේ මැතිවරණ කොට්ඨාශ මට්ටමින් සංවර්ධන කටයුතු අධීක්ෂණය කරන කාර්යාලයක් පාටිෂන් කිරිමට කොන්ත්‍රාත්කරුවෙකුට භාර දී ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම වූ රු.930,000 ක් විශේෂ ව්‍යාපෘති කාර්යාලයේ නිලධාරිණියක් විසින් ගෙවීම් කර තිබුණි. එම ඇස්තමේන්තුගත වියදමින් නිර්දේශ කර තිබුණු රු.906,250 ක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පියවා තිබුණි. එම කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් මුළු වටිනාකමෙන් සියයට 5 ක් රඳවා ගෙන නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 162 | 45 | 226 | 11 | 64 |
| තෘතියික මට්ටම | 23 | 95 | 16 | 128 | 07 | 33 |
| ද්විතියික මට්ටම | 326 | 80 | 258 | 104 | 68 | 24 |
| ප්‍රාථමික මට්ටම | 603 | 142 | 475 | 168 | 128 | 26 |
| **එකතුව** | **1,008** | **479** | **794** | **626** | **214** | **147** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ස්ථිර තනතුරුවල 214 ක පුරප්පාඩු පැවති අතර තාවකාලික තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 147 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.